# Sri Lak Laboratory Services (Pvt) Ltd හි ජල පරීක්ෂා ගාස්තු

## අපජල පරීක්ෂා

Sri Lak Laboratory Services (Pvt) Ltd වෙත භාරදෙනු ලබන අපජල නියැදි සහ අප විසින් නිසි ක්‍රමවේදයන් අනුගමනය කරමින් එකතුකරණ අපජල නියැදිද පරීක්ෂා කරණු ලැබේ. රසායනාගාරයට භාරදෙනලද හෝ අප විසින් එකතුකරණලද අපජල නියදි රසායනාගාරයට ලැබී 7 වන දින අදාල පරීක්ෂා වාර්තා බාරදීමට සුදානම්ය.

පහත සඳහන් විස්තර අප වෙත ඊ-මේල් කිරීමෙන් දින 1-2 කාලයක් තුල සේවාදායකයා වෙත පරීක්ෂා සඳහා වන ගාස්තුව ඊ-මේල් මගින්ම ලබාගත හැකිය.රසායනාගාරය වෙත පැමිණෙන සේවාදායකයන්ගේ කැමැත්ත පරිදි මිලගණන් ලබාගැනීමට හෝ නියැදි එකතුකිරීම සුදානම් කරගත හැකිය.

පරීක්ෂා වාර්තා සේවාදායකයා වෙත යැවීම අවශ්‍ය වන්නේනම් ඒ සඳහා අතිරේක රුපියල් 300.00 ක ගාස්තුවක් ගෙවීමෙන් නියැදිය රසායනාගාරයට ලැබුණ දින සිට 7 වන දින අධිවේගී තැපැලවෙත වාර්තා භාරදෙනු ලැබේ. ඔබ අතින් පරීක්ෂා වාර්තා ලබාගන්නේනම් නියැදි භාරදුන් හෝ එකතු කල දින සිට 7 වන දින සිට කාර්යාල වෙලාවේදී සිදුකළ හැකිය.

Sri Lak Laboratory Services (Pvt) ltd පාරිසරික ආරක්ෂණ බලපත්‍ර වල අත්‍යාවශ්‍ය පරාමිතීන් පරීක්ෂාව සඳහා ප්‍රනීතනය කරණ ලද රසායනාගාරයකි. ඒ සඳහා පරීක්ෂා සිදුකර වාර්තා නිකුත්කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ (CEA) ලියාපදිංචි කර ඇති අතර පරීක්ෂාවන් ISO 17025:2005 ට අනුකූල වේ. ( ප්‍රනීතන සහතිකය සහ විෂය පථය බැලිය හැකිය.)

ගණනය කිරීම සඳහා අවශ්‍යවන පහත විමසන විස්තර සැපයීමෙන් නොපමාව අපජල විශ්ලේෂණ සඳහා මිලගනන් ලබාගත හැකිය.

1. ආයතනයේ හෝ සේවාදායකයාගේ නම සහ ලිපිණය;
2. නියැදි එකතු කරන්නේ සේවාදායකයාද නැතහොත් රසායනාගාරය නියැදි එකතු කලයුතුද යන වග;
3. මෙම පරිශ්‍රයෙන් එකතු කල යුතු නියැදි සංඛ්‍යාව.
4. කර්මාන්තයේ ස්වභාවය.
5. වාර්තාව ඉදිරිපත් කරන්නේ කවරකු වෙතද?/ කුමන ආයතනයක් වෙතද? / සේවයෝජකයාගේ ප්‍රයෝජනය සඳහාද යන බව.
6. පරීක්ෂා කිරීම සඳහා ඔබ විසින් යම් විශේෂිත පරාමිතියක් පරීක්ෂා කිරීම සඳහා හඳුනාගෙන ඇත්නම් එය සඳහන් කරන්න. එසේ නොවේනම් ගැසට් නිවේදනය අනුව අප විසින් ඇස්තමේන්තුව සකසනු ලැබේ.
7. සම්බන්ධීකරකයාගේ විස්තර, ජංගම දුරකථන අංකය සහිතව;
8. ජලනියදී එකතුකලයුතු හෝ පරීක්ෂකලයුතු දිනය දල වශයෙන්.
9. ප්‍රථමවරනම් අපජලය බැහැර කරන්නේ කෘෂිකර්මයටද / මතුපිට ජල මාර්ගයකටද / මුහුදු වෙරලටද හෝ නැවත භාවිතා කරනවාද යන බව.
10. පරීක්ෂා වාර්තාව සේවාදායකයා විසින් භාරගන්නවාද නැතහොත් එක්දින ප්‍රවාහනය මගින් ලබාගන්නවාද යන බව.
11. අපජලය නිකුත්කරන ස්ථානයේ විස්තර. මධ්‍යම පරිසර අධිකාරිය නිකුත්කළ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ පිටපත ඉදිරිපත් කරන්න.
12. වෙනත් අවශ්‍ය විස්තර වේනම්.